www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂය පක්ෂ ලියාපදිංචිය දිනාගනියි

**Socialist Equality Party in Australia achieves party registration**

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය**
**2007 සැප්තැම්බර් 26**

ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂය ෆෙඩරල් (සමූහාන්ඩු) පක්ෂ ලියාපදිංචිය දිනාගැනීම මගින් එලඹෙන ෆෙඩරල් මැතිවරනය සිය නාමය යටතේ තරග කිරීමේ හැකියාව හිමිකරගෙන ඇත. සසප ලියාපදිංචි කර ඇත්තේ පක්ෂ සමාජිකයන් විසින් සාමූහිකව ගෙනගිය ව්‍යාපාරයකින් පසුව සැප්තැම්බර් 17 දින ඕස්ට්‍රේලියානු මැතිවරන කොමිසම (ඒඊසී) විසින් ය.

එහි ප්‍රතිඵලය ලෙස නියෝජිත මන්ත්‍රී මන්ඩලයට තරඟ වදින සෑම සසප අපේක්ෂකයෙකුට ම ඔහුගේ හෝ ඇගේ නම පසෙකින් "සමාජවාදී සමානතා පක්ෂයේ" නම සඳහන් කිරීමට හිමිකම ලැබේ. සසපය සෙනෙට් සභාවට අපේක්ෂකයන් ඉදිරිපත් කරන සෑම විටම පක්ෂයේ නාමය ප්‍රාන්තය පුරා සියලු ඡන්දදායකයන් වෙත බෙදාහැරෙන ඡන්ද පත්‍රිකාවේ " ඉරට උඩින්" සඳහන් කෙරෙයි. මේ තීරනය මගින් යුද්ධයට, සමාජ අසමානතාවයට හා මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට වඩවඩාත් එල්ල කෙරෙන ප්‍රහාරයන්ට එරෙහිව, 2007 ෆෙඩරල් මැතිවරන ව්‍යාපාරය තුලට පක්ෂය මගින් ගෙනයනු ලබන සෘජු මැදිහත්වීම සඳහා මග පෑදෙනු ඇත.

පසුගිය දශක දෙක තුල කම්කරු පක්ෂයට හා ලිබරල් ජාතික හවුලට ලැබුනු සහයෝගය හීන වී ඇති අතර, සුලු හා තෙවැනි පක්ෂවලට මැතිවරන තරග කිරීමට ඇති හැකියාව මත වඩවඩාත් පැනවෙන සීමාවන්ට මුහුන පෑමට සිදුව තිබේ.

පොදුරාජ්‍ය මන්ඩලයේ ඡන්ද දායක පනතේ මෑතකදී කල සංශෝධනයන්හි අර්ථය වන්නේ, නීති උපදෙස් සඳහා පහසුකම්, පූර්න කාලීන කාර්යධරයන්, විශාල සාමාජිකත්වයක් හා සැලකිය යුතු මූල්‍ය සම්පත් නොමැතිව සංවිධානයක් හෝ දේශපාලන පක්ෂයක් පිහිටුවීම හෝ ලියාපදිංචි කිරීම කල නොහැකි තරමේ දුෂ්කර කාර්යයක් වී ඇති බවයි.

ඒ සමග ම, ඒඊසීය දියත්කර තිබෙන "ඔබගේ ඡන්දය අගනේය" යන ප්‍රසිද්ධ ප්‍රචාරක ව්‍යාපාරය තිබියදී ම, ඡන්දය දීමේ අයිතිය ම ප්‍රහාරයට ලක්ව තිබේ. ෆෙඩරල් මැතිවරන ප්‍රකාශයට පත් කල දිනයේ ඡන්දදායක කටයුතු තහනම් කරමින් මෑතක දී හොවාඩ් ආන්ඩුව සම්මත කල නීතියෙන් නව ඡන්දදායකයන් ලේඛනගත කිරීම වැලැක්වෙන අතර විශේෂයෙන්ම තරුන ඡන්ද දායකයන් ලක්ෂ ගනනකගේ ඡන්දය උදුරාගැනීමක් සිදු වෙයි.

## ප්‍රජාතන්ත්‍ර විරෝධී වංකගිරිය

ඡන්ද දායක පනතේ ප්‍රජාතන්ත්‍ර විරෝධී වගන්ති යටතේ, අවම වශයෙන් සාමාජිකයන් 500කගේ වත් නම, ලිපිනය ඇතුලු විස්තර ඒඊසීයේ සමාලෝචනය සඳහා සැපැයිය යුතු ය. මුලුමනින්ම පදනම් විරහිත සංඛ්‍යාවක් වන සාමාජිකයන් 500ක්, නොමැති පක්ෂ පක්ෂයක් ලෙස ලියාපදිංචිවීම සඳහා සුදුසුකම් නොලබයි.

ලියාපදිංචිය අපේක්ෂා කරන නව හා "කුඩා" පක්ෂ "කැච් 22" යන දුෂ්ට තත්වයට මුහුන දෙයි. තමන්ගේම පක්ෂ නාමය යටතේ මැතිවරනවලට තරග කොට ඒ මගින් සහයෝගය දිනා ගැනීම තහනම් කර ඇති තත්වය තුල එම පක්ෂ, ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය සඳහා අවශ්‍ය කෙරෙන සිය ගනනක් සාමාජිකයන් ලබාගන්නේ කෙසේ ද?

පක්ෂයට සාමාජිකයන් 500ක් හෝ වැඩි ගනනක් සිටියත්, ඒඊසීය මගින් ක්‍රියාත්මක කෙරෙන සාමාජික ලේඛන සමාලෝචනය කිරීමේ විධික්‍රම බෙහෙවින්ම අත්තනෝමතික ය. නම් ඉදිරිපත් කල අවස්ථාවේ සාමාජිකයන් 20 දෙනෙක් නියැදියක් ලෙස අතරින් පතර තෝරා ගනු ලබයි. 20 දෙනා අතරින් 19 දෙනෙකුට දුරකථන ඇමතුම් තුනකින් වත් කථා කල නොහැකි වුවහොත් හෝ ඉන් පසුව යවන ලිපියට පිලිතුරක් ලබාගත නොහැකි වුවහොත් පක්ෂයේ නියැදිය ප්‍රතික්ෂේප වේ.

ඉල්ලුම් කරන පක්ෂවල සාමාජිකයන්ගේ නියැදි ප්‍රථම වතාවේ දී ම හෝ පසුව අතරින් පතර කෙරෙන පරීක්ෂාවේ දී ප්‍රතික්ෂේප වීම අසාමාන්‍ය දෙයක් නො වේ. මෙම වසර තුල මෙතෙක් අවම වශයෙන් මානව අයිතීන් පිලිබඳ පක්ෂය, බ්‍රැන්ඩන් රේනෝගේ හරිත

ලිබරල් පක්ෂය හා අඩු මිල පැට්‍රල් පක්ෂය යන තුනේ පක්ෂ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කර ඇත. ඒ, "සාමාජික වංචා කිරීම්" ඇත්දැයි අතරින් පතර කෙරෙන එවැනි සොයාබැලීම්වලින් පසුව ඒවායේ සාමාජික ලේඛන ප්‍රතික්ෂේප වීමේ පදනම මතය. ඕස්ට්‍රේලියානු අගනුවර අවට ඕස්ට්‍රේලියානු ඩිමොක්‍රැටිකයන්ගේ ලියාපදිංචිය අවලංගු වී ඇත්තේ ඔවුන්ට 100ක් වන අවම සාමාජික සංඛ්‍යාව ඉදිරිපත් කිරීමට නොහැකි වීම නිසා ය.

සසපය ලියාපදිංචිය සඳහා සිය අයදුම්පත ඉදිරිපත් කලේ අගෝස්තු 1 දිනය. 20 දෙනාගේ ප්‍රථම සාමාජිකත්ව නියැදියේ පක්ෂ සාමාජිකයන් දෙදෙනෙකු ඇමැතීමට නොහැකිවීමේ හේතුව මත එය ප්‍රතික්ෂේප වීමට ආසන්න විය. ඒඊසීය මෙම "අස්ථානගත" සාමාජිකයන්ගේ අනන්‍යතාව හෙලි නොකල තතු යටතේ අත් නොහැර කල වෙහෙසකර පරීක්ෂාවකින් පසුව පක්ෂ ක්‍රියාකාරීන් ඔවුන් සොයා ගත් අතර හෙලිදරව් වූයේ ඒඊසීයේ සොයාබැලීම් කිසිසේත්ම බැරෑරුම්ව සිදුවී නැති බවයි. බ්‍රිස්බේන්හි එක් සාමාජිකයෙකුට ඒඊසීයේ ලිපිය ලැබී තිබුනේ අගෝස්තු 16 දිනය. ඔහු වහාම සසපයේ ජාතික කාර්යාලයට කතා කලේ ය. ඔහුගේ සේවා ස්ථානයට කාර්යාල වේලාවන් තුල ඒඊසීයෙන් කිසිදු ඇමතුමක් ලැබී නොතිබීම ගැන ඔහු කෝපයට පත්ව සිටයේ ය. ඔහු තමන්ව සම්බන්ධ කරගත හැකි විස්තර සාමාජික පෝරමයෙහි ඇතුලත් කර තිබූ අතර අනෙක් සියල්ල සමග සසප එය ඒඊසීය වෙත ඉදිරිපත් කර තිබුනි. ප්‍රශ්නයට මැදිවූ සමාජිකයා සිය තැපැල පරීක්ෂා කර නොතිබුනේ ද? ඔහු වෙනතකට ගොස් සිටියේ ද? නැත්නම් ඒඊසීයේ ලිපිය අස්ථානගත වී ද? මේ කුමකින් හෝ සිදු විය හැකිව තිබුනේ සසපයේ මුලු සාමාජික ඉල්ලුම්පත ම අනතුරට පත්වීම ය.

විවිධ යන්ත්‍රයන්ගෙන් යුක්ත විස්තීර්න ඡන්ද නීතිය යටතේ සියල්ල හොඳින් සිදුවේ යයි සිතන පක්ෂ උගුලේ හසු කර ගත හැකි අතර අධිකරන ක්‍රියාමාර්ගයකට ඔවුන් යොමු කල හැකි අතර දඩ හා බන්ධනාගාර ගත කිරීමට පවා යටත් කෙරේ. 2003 ඔක්තෝබරයේ දී පෝලින් හැන්සන් සහ ඩේවිඩ් එට්රිජ් යන දක්ෂිනාංශික ජනතාවාදී එක්ජාතියක පක්ෂ නායකයන් දෙදෙනා අපරාධ සංග්‍රහයේ මැතිවරන වංචාකිරීමේ චෝදනාව යටතේ අත් හිටවූ සිරදඬුවම් නොපනවා ම තෙවසර බැගින් බන්ධනාගාර ගත කෙරුනි. සංවිධානාත්මක තාක්ෂනිකත්වයේ පදනම මත අධිකරනය පසුව තීන්දු කලේ, ඔවුන් ඉදිරිපත් කල නම් හා ලිපිනයන් සහිත සාමාජිකයන් 500 දෙනා සාමාජිකයන් නොව හුදෙක් ආධාරකරුවන් පමනක් බවය. ඒ මත ඔවුන්ට චෝදනා ගොනු කරනු ලැබිනි. මේ පිලිබඳව සසපය පැහැදිලි කර තිබූ පරිදි එක් ජාතියක් පක්ෂයේ නායකයන් දෙදෙනෙකු බන්ධනාගාර ගත කිරීම පෙන්නුම් කරන්නේ මෙය "හැන්සන්ගේ පක්ෂය මෙන් නොව, සමස්ථ දේශපාලන සංස්ථාපිතයට හා ධනේශ්වර ලාභ පද්ධතියට ම, අව්‍යාජ හා ප්‍රගතිශීලී විකල්පයක් ඉදිරිපත් කරන පක්ෂවලට එරෙහිව යොදාගැනීම් සඳහා නිර්දය, යටිකුට්ටු හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවේදයන් මුවහත් කෙරෙමින් තිබෙන බවට අනතුරු ඇඟවීමක්" බව ය. ඔවුන්ගේ දඬුවමට එරෙහිව ඉදිරිපත්කල අභියාචනය ජය ගැනීමෙන් පසු හැන්සන් සහ එට්රිජ් නිදහස් විය.

එතැන් සිට, මැතිවරන තරග කිරීමෙන් " තුන්වැනි" හෝ "කුඩා" පක්ෂ වැලැක්වීම සඳහා යොදාගන්නා ප්‍රජාතන්ත්‍ර විරෝධී කොන්දේසි සමග මැතිවරන පනත සංශෝධනය කර ඇත.

2006 දෙසැම්බර් 22 දින, වර්තමානයේ හෝ අතීතයේ දී පාර්ලිමේන්තු නියෝජනයක් නොතිබුනු, ලියාපදිංචි පක්ෂවලට ඕස්ට්‍රේලියානු මැතිවරන කොමිසම ලිඛිතව දන්වා දිටියේ දින පහක් තුල තම පක්ෂවල ලියාපදිංචිය අහෝසි කරන බවයි. 2006 මැතිවරන හා ජනාධිපතිවරන සංශෝධිත පනතේ නව සංශෝධන යටතේ ක්‍රියාත්මක කල පෙර නොවූ විරූ මෙම පියවරෙහි අර්ථය නම් මෙම මැතිවරන වර්ෂයේ ආරම්භයේ දී ම ෆෙඩරල් ලියාපදිංචිය සහිත පක්ෂ සංඛ්‍යාව 11ට සීමා කිරීම යි. ඒවානම්, ඒඑල්පී, ලිබරල් ජාතික, ඩිමොක්‍රැටික, හරිත, පවුල පලමුව, ලේබර්, ඩිමොක්‍රැටික් ලේබර්, න්‍යෂ්ටික අවිහරන, එක් ජාතියක් හා පීටර් ඇන්ඩ්‍රූන් නිදහස් කන්ඩායමයි. මේ, මිලියන 21 කට ආසන්න ජනගහනයක් ඇති රටෙහි ය.

ලියාපදිංචිය අවලංගු කල පක්ෂවලට බලකෙරී ඇත්තේ ඔවුන්ගේ ලියාපදිංචියට අභියෝග කල හැකි පදනම පුලුල් කිරීම අරමුනු කරගෙන ඉදිරිපත් කොට ඇති නව "නම් කිරීමේ කොන්දේසි" යටතේ යලි ඉල්ලුම් කිරීමටයි.

සසපය ෆෙඩරල් ලියාපදිංචිය පලමුව ලබාගත්තේ 1988දී ය. එහෙත් එක් ජාතියක් පක්ෂ නායකයන්ට එරෙහි නීතිමය පියවර උත්සන්නව තිබිය දී, 2002 දී සිය ලියාපදිංචිය ඉල්ලා අස්කර ගත්තේ ය. මැතිවරන නීතියේ මෑත සංශෝධනවල විෂය ක්ෂේත්‍රය පිලිබඳව පුලුල් නීතිමය උපදෙස් ලබාගැනීමෙන් පසුව සසපය ෆෙඩරල් ලියාදිංචිය සඳහා මෙම වසරේ මැයි මාසයේ දී නව උද්සෝෂනයක් දියත් කලේය.

පක්ෂය 500කට වැඩි සාමාජිකයන් පිරිසකගේ නම් ඉදිරිපත් කල අතර පනත යටතේ අවශ්‍ය අනෙකුත් සුදුසුකම් ද සම්පූර්න කලේ ය. එහි ලියාපදිංචියේ ඉල්ලුම්පත ඒඊසීය විසින් අගෝස්තු මැද ජාතික පුවත්පත්වල ප්‍රසිද්ධියට පත් කරමින් සැප්තැම්බර් 14 දිනට පෙර විරෝධතාවන් කැඳවුම් කලේ ය. අභියෝගයක් එල්ල නොවූ තතු තුල සැප්තැම්බර් 17

දින පක්ෂය නිල වශයෙන් ලියාපදිංචි කල බව සැප්තැම්බර් 18 දින පක්ෂයට දැනුම් දෙන ලදී.

සසපය කල් නොයවා සිය මැතිවරන ව්‍යාපාරය දියත් කරන අතර එහි දී ව්‍යවස්ථාදායකයට හා සෙනේට් සභාවට තරග කරන පක්ෂයේ අපේක්ෂකයන් නිවේදනය කෙරෙනු ඇත. ප්‍රාදේශීය මැතිවරන කමිටුවලට බැඳෙමින් ද, පක්ෂයේ මැතිවරන ප්‍රකාශනය හා නිතිපතා පලවන අපේක්ෂකයන්ගේ ප්‍රකාශ ප්‍රදේශ තුල බෙදාහැරීමට සහාය දෙමින් ද, පක්ෂයේ මැතිවරන අරමුදලට නොමසුරුව ආධාර කරමින් ද, 2007 ෆෙඩරල් මැතිවරනයේ අව්‍යාජ සමාජවාදී විකල්පය කම්කරු පන්තියේ හැකි පුලුල්ම ස්තරයන් වෙත ගෙනයෑම මගින් තමන්ට හැකි පුලුල් සහයෝගය මෙම ව්‍යාපාරයට ලබා දෙන මෙන් අප සියලු ලෝසවෙඅ පාඨකයන්ගෙන් හා පක්ෂ ආධාරකරුවන්ගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org